**රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 12/93**

මගේ අංක :- 111-309 ඊ 207/29/ඩීසී
රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
1993 ජූනි මස 07 වෙනි දින

සියළුම ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්.

**මෝටර් රථ රියදුරන් සඳහා රාජකාරි වේලාවන්**

මෝටර් රථ රියදුරන්ට අතිකාල දීමනා ගෙවීම පිළිබඳව නිකුත් කර ඇති 1979 ජූනි මස 26 දිනැති ආයතන චක්‍රලේඛ ලිපි අංක 318 කෙරෙහි ඔබේ අවධානය යොමු කරවමි.

02. මෝටර් රථ රියදුරන්ගේ සාමාන්‍ය රාජකාරි කාලය පහත සඳහන් පරිදි වෙනස් කරනු ලැබේ.

(I) මෝටර් රථ රියදුරන් දින පහේ සතියක් රාජකාරියේ යෙදෙන්නේ නම් කෑම පැය ඇතුළුව දිනකට පැය දහයක් සේවය කළ යුතුය.

(II) දින හයේ සතියක් රාජකාරියේ යෙදෙන්නේ නම්, කෑම පැය ඇතුළුව දිනකට පැය අට හමාරක් සේවය කළ යුතුය.

(III) සෙනසුරාද දිනයන්හි දී ද රාජකාරියෙහි යෙදීමට නියමිත රියදුරන් සඳහා එදින පැය හත හමාරක් සේවය කිරීමෙන් සතියකට නියමිත පැය ගණන වන පැය 50 ආවරණය කිරීමට ඉඩ දිය හැක.

මෙය සියළුම වර්ග වල රථවාහන රියදුරන් සඳහා අදාල වේ.

03. මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලබන්නේ භාණ්ඩාගාරයේ එකඟත්වය ඇතිවය.

අ.කලේ/කේ.එච්. කැමිලස් ප්‍රනාන්දු,
වැඩබලන ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය